**මුලටියන ප්‍රාදේශීය සභාව**
**මාතර දිස්ත්‍රික්කය**
**----------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මුලටියන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**--------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව වෙත පරිත්‍යාග ලෙස ලැබී තිබූ රු.715,714 ක් වන ජල බවුසරයෙහි වටිනාකම සහ වටිනාකම අගය කර නොතිබූ ස්කිඩ් ස්ටියර් ලෝඩර් යන්ත්‍රය ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මිලදීගත් හා විවිධ ප්‍රතිපාදන යටතේ නිමකර තිබූ ඉදිකිරීම්වලට අදාලව එකතුව රු.2,359,346 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සභා අරමුදල් යටතේ ආරම්භ කර නොතිබූ කර්මාන්ත 05 ක් වෙනුවෙන් රු.2,425,400 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු ණයහිමියෝ රු.218,426 ක් හා ණයගැතියෝ රු.63,322ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු රු.1,194,404 ක දායක මුදල වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඊ) ඉකුත් වර්ෂයට අදාලව ගෙවා තිබූ රු.119,122 ක් වූ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඖ) වැඩයෝජනාව අවලංගු වීම හේතුවෙන් ආපසු යවා තිබූ රු.50,000 ක මුදල ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

----------------------

එකතුව රු.72,372,910 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළ ශේෂ හා ඊට අදාළ උපයෝගී ලේඛන/උපලේඛනවල දැක්වෙන ශේෂ අතර, එකතුව රු.32,540,848 ක අසමානතා පවතින බව නිරීක්ෂණය විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම**

-------------------

2013 වර්ෂයේ සිට නොවෙනස්ව ගිණුම්වල ඉදිරියට ගෙනෙමින් පවතින අවිනිශ්චිත ගිණුමේ වූ රු.36,289 ක බැර ශේෂය හඳුනාගෙන නිරවුල්කර නොතිබුණි.

**1.3.4 ගෙවියයුතු ගිණුම්**

--------------------

සමාලෝචිත වර්ෂයේ අවසානයට එකතුව රු.16,135,745 ක් වූ කර්මාන්ත ණයහිමි ශේෂය තුළ වර්ෂ 03 ක කාලයක් ඉක්මවූ එකතුව රු.684,191 ක ශේෂ ඇතුළත් වී තිබුණි.

**2.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම**

----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.140,835,769 ක්වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.6 අනුකූල නොවීම්**

--------------------

**1.3.6.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමඟ වැය විෂයයන්හි තථ්‍ය වියදම්, අතිරික්තතා හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | රීති 199 | ඉන්වෙන්ට්‍රි පොතේ හෝ තොග ලේඛනයේ හෝ වෙනත් ලේඛනයක හෝ පොතක ලැබීම් සටහන් කරනු ලබන පැත්තේ සෑම සටහනක් ඉදිරියෙන්ම භාණ්ඩ මිලදී ගැනීමට අදාල ගෙවීම් වවුචරයේ අංකය හා දිනය සඳහන් කර නොතිබුණි. |
| (iii) | රීති 217 හා 218 | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ වාර්ෂික සමීක්ෂණ පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.12,685,046 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,252,522 ක් විය.

**2.2** **ආදායම් පරිපාලනය**

----------------------

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

---------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | **2017** | | | | **2016** | | | |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම් ප්‍රභවය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** | **ඇස්තමේන්තුගත ආදායම** | **බිල්කළ ආදායම** | **රැස්කළ ආදායම** | **දෙසැම්බර් 31 දිනට මුළු හිඟය** |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 281,000 | 22,342 | 15,892 | 76,231 | 721,299 | 25,988 | 109,984 | 69,781 |
| කුලී | 4,166,200 | 4,547,260 | 4,592,409 | 478,331 | 2,836,957 | 4,734,929 | 4,695,029 | 523,480 |
| බලපත්‍ර ගාස්තු | 1,131,300 | 1,746,206 | 1,746,206 | 10,450 | 476,520 | 231,371 | 230,371 | 10,450 |
| වෙනත් ආදායම් | 16,670,500 | 15,716,053 | 13,666,819 | 14,918,074 | 13,852,730 | 9,321,712 | 5,331,192 | 12,868,840 |
| -එකතුව- | 22,249,000 | 22,031,861 | 20,021,326 | 15,483,086 | 17,887,506 | 14,314,000 | 10,366,576 | 13,472,551 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**

-------------------------------------

සමාලෝචිත වර්ෂයට ඇස්තමේන්තුගත කළ මුළු ආදායම රු. 22,249,000 ක් වූ අතර බිල් කළ ආදායම රු.22,031,861 ක් විය. රු.13,472,551 ක් වූ ආරම්භක හිඟය සමඟ අයවිය යුතු මුළු මුදල රු.35,504,412 ක් වුවද, වර්ෂය තුළ රැස්කළ මුළු ආදායම රු.20,021,326 ක් වීමෙන් වර්ෂය අවසානයට මුළු හිඟය රු.15,483,086 ක් වී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

----------------

**අක්කර බදු**

------------

ආරම්භක හිඟය රු.69,845 ක් වූ අතර, රු.22,342 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.92,187 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.15,891 ක් වීම නිසා, වර්ෂය අවසානයට රු.76,296 ක හිඟ ශේෂයක් පැවතුණි.

**2.2.4 බදු කුලී**

--------

ආරම්භක හිඟය රු.487,400 ක් වූ අතර, රු.4,517,850 ක් වූ වර්ෂයේ බිල්කිරීම් සමඟ රු.5,005,250 ක් අයවිය යුතුව තිබුණි. මුළු අයවීම් රු.4,562,999 ක් වූ නිසා, වර්ෂය අවසානයට රු.442,251 ක් හිඟව පැවතුණි.

**2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

-------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට අය විය යුතු උසාවි දඩ රු.1,980,474 ක් හා මුද්දර ගාස්තු රු.12,616,481 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1 කාර්යසාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම (output) ලබා නොගැනීම**

---------------------------------------------------------

2017 වර්ෂයේදී වැඩ යෝජනා 48 ක් සහා අරමුදලින් සහ විවිධ ප්‍රතිපාදන මඟින් ඉටු කිරීම සඳහා රු.14,400,000 ක් අයවැය ලේඛනය මගින් වෙන්කර තිබුණද, වර්ෂය තුළ ඉන් ඇස්තමේන්තුගත මුදල රු.600,000 ක්වූ වැඩ යෝජනා 02 ක් පමණක් ඉටු කර තිබුණි. අයවැය ලේඛනයේ සඳහන් නොවූ රු. 8,565,405 ක්වූ කර්මාන්ත 25 ක් විවිධ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කර තිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**-------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂය තුළ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් වැටුප් හා දීමනා, ඉන්ධන හා වාහන අළුත්වැඩියා වෙනුවෙන් රු. 3,937,463 ක වියදම් දරා තිබූ අතර, කසළ එකතු කිරීමෙන් රු.51,250 ක ආදායමක් උපයාගෙන තිබුණි.

(ii) වාර්ෂිකව එකතු කරන ලද කිලෝග්‍රෑම් 370,800 ක කසළවලින් කාබනික පොහොර කිලෝග්‍රෑම් 4,175 ක්, නිපදවා තිබූ අතර කාබනික පොහොර නිපදවිය නොහැකි සියයට 68 ක තරම් ප්‍රමාණයක්, සභාව සතු ඉඩමකට බැහැර කර තිබුණද, එම ඉඩම සඳහා පරිසර බලපත්‍රය ලබාගෙන නොතිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

**--------------------------**

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ , තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද එම අරමුණු හා ඉලක්ක මැනීම සඳහා දර්ශක හඳුනාගෙන නොතිබූ අතර අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සභාව විසින් ලබා ගෙන නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) අනුමත කාර්ය මණ්ඩලයෙහි පුරප්පාඩු 05 ක් සඳහා බඳවා ගැනීමට කළමනාකරණ සේවා අධ්‍යක්ෂගේ අනුමැතිය ලැබී තිබුණද එම තනතුරු සඳහා බඳවා ගැනීම් කර නොතිබුණි.

(ආ) භාණ්ඩාගාර ලේකම්ගේ 2014 මාර්තු 31 දිනැති අංක 3/2014 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුකූල නොවන පරිදි බඳවාගෙන තිබූ සේවකයෙකුට 2017 වර්ෂය තුළ රු.320,500 ක මුදලක් වැටුප් ලෙස ගෙවා තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**------------------------------**

පිඹුරු අංක 6355 සහ 6355 ඒ මගින් කැබලි සැලැස්ම අනුමත කර වෙන්දේසි කල ඉඩමෙන් සභාවට ලැබිය යුතු රූඩ් 01 පර්චස් 28.3 ක් සභාවට ලබාගෙන නොතිබූ අතර තවත් ඉඩමක් වෙන්දේසි කිරීමේදී සභාවට ලැබිය යුතු ඉඩම් ප්‍රමාණය රූඩ් 01 ක් අඩුවෙන් ලබාගෙන තිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

### 3.4.1 වත්කම් ලේඛනගත නොකිරීම

(අ) පොදු කටයුතු වෙනුවෙන් සභාවට ලැබී තිබූ රූඩ් 02 පර්චස් 05 ක් වූ තැන්නහේන ඉඩම ලේඛනගත කර නොතිබූ අතර එකතුව අක්කර 24 රූඩ් 2.8 ක් වූ ඉඩම් 07 ක ඔප්පු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) පිඹුරු අංක 240/1991 මගින් අනුමත කළ බිම් සැලැස්ම මගින් වෙන්දේසි කළ ඉඩමෙන් සභාවට ලැබිය යුතු අක්කර 01 රූඩ් 02 පර්චස් 22 ට අදාළ ඔප්පු ලබාගෙන නොමැති අතර ස්ථාවර වත්කම්වලටද ඇතළත් කර නොතිබුණි.

### 3.4.2 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

සභාවට අයත් රු. 3,075,414 ක් වටිනා ඉඩම් 09 ක ආරක්ෂාව සඳහා වැට මායිම් සකස් කර ආරක්ෂිත වැඩ පිළිවෙලක් යොදා නොතිබුණි.

### 3.5 ආර්ථික නොවූ ගණුදෙනු

ශ්‍රී ලංකන් යූත් ක්‍රීඩාංගන ඉදිකිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.2,403,725 ක මුදලක් වැයකොට දිවාරාත්‍රී වොලිබෝල් ක්‍රීඩාංගනයක් සහා දේපලක් නොවන දෙයියන්දර ජාතික පාසලේ ඉදිකර තිබූ අතර, පසුගිය වසර 03 ක කාලයක් තුල එය නිෂ්ක්‍රියව පැවතුණි. රු.2,929,419 ක්වූ කොන්ත්‍රාත්තුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල නොවන පරිදි අදියර 02 ක් යටතේ වෙන්කර එක් සමිතියක් සමඟ ගිවිසුම්ගත වී තිබුණි. භෞතික පරීක්ෂාව අනුව ක්‍රීඩාපිටියේ නිමාව අක්‍රමවත්ව තිබූ අතර වැඩ විෂයයන් 02 ක් විධිමත්ව ඉටු නොකර තිබියදී රු.360,000 ක් ගෙවා තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත හා තථ්‍ය ආදායම හා වියදම අතර පහත විස්තර දැක්වෙන පරිදි සැළකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(අ) වියදම් විෂයයන් 07 ක ඉතිරි කිරීම් වල එකතුව රු.9,768,140 ක් වූ අතර, එම වටිනාකම සියයට 14 සිට සියයට 100 අතර පරාසයක පැවතුණි.

(ආ) එක් වියදම් විෂයක අහිතකර විචලනය රු.519,673 ක් වූ අතර, එම වටිනාකම සියයට 26 ක් විය.

(ඇ) ආදායම් විෂයයන් 04 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු.8,038,390 ක් වූ අතර, එම වටිනාකම සියයට 07 ක් හා සියයට 92 ක් විය.

## 4.2 අභ්‍යන්තර විගණනය

-----------------------

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 134 හි දැක්වෙන විධිවිධානයන් සහ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2014 පෙබරවාරි 24 දිනැති අංක දපපා/යභ/01/න.ච.ලේ. දරන චක්‍රලේඛය ප්‍රකාර ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි. මුදල් රෙගුලාසි 134 ප්‍රකාර අභ්‍යන්තර විගණන වැඩසටහන් පිළියෙල කිරීමේදී විගණකාධිපති සමග සාකච්ඡා කර නොතිබුණු අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ස්ථාවර වත්කම්

(ආ) ආදායම් පාලනය

(ඇ) අයවැය පාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) ගිණුම්කරණය